අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/16/01/05/01 — ඔබේ යොමුව / உமது இல. / Your Ref. — දිනය / திகதி / Date 2024.11. 22

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම විදුහල්පතිවරුන් (ප්‍රාථමික පන්ති පැවැත්වෙන රජයේ පාසල් හා රජයේ අනුමත පෞද්ගලික පාසල්)

**<u>2025 වර්ෂයේ පළමුවන ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් සඳහා පන්ති ආරම්භ කිරීම</u>**

රජයේ පාසල්වල හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල 2025 වර්ෂයේ දී පළමුවන ශ්‍රේණියේ සිසුන් සඳහා පන්ති ආරම්භ කිරීම සිංහල, දෙමළ හා මුස්ලිම් පාසල් සඳහා 2025.01.30 බ්‍රහස්පතින්දා සිදු කිරීමට තීරණය කර ඇත .

2. ඒ අනුව 2025 වර්ෂයේ පළමුවන ශ්‍රේණියට පිවිසෙන නවක සිසුන් පිළිගැනීම සඳහා සුදුසු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කළ යුතුය. සැමවිටම නවක සිසුන්ට ප්‍රමුඛතාවයක් ලැබෙන පරිදි වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුවේ. එසේම සිසුන්ට හා දෙමාපියන්ට අපහසුතාවක් සිදුනොවන අයුරින් මෙම වැඩසටහන සංවිධානය කර ගැනීමට ද අවධානය යොමු කළ යුතුය. මෙහි දී ප්‍රාථමික අධ්‍යාපනයේ අරමුණු, ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන අවධි, ප්‍රාථමික අධ්‍යාපන නිපුණතා පාදක විෂය මාලාව, සිසුන්ගේ කායික හා මානසික සංවර්ධනය, අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හා අභිමත ඉගෙනුම් නිපුණතා, තක්සේරුකරණය හා දරුවන් හඳුනාගැනීමේ වැඩසටහන ආදි කරුණු පිළිබඳව පළමුවන ශ්‍රේණියට පිවිසෙන සිසුන්ගේ දෙමාපියන්ට පහසුවෙන් අවබෝධ කරගත හැකිවන පරිදි ඔවුන් දැනුවත් කිරීම ඉතා වැදගත් ය.

3. තවද, 2025 වර්ෂයේ පළමුවන ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන් සඳහා "දරුවන් හඳුනාගැනීමේ වැඩසටහන", 2025.01.31 සිකුරාදා ආරම්භ කර 2025.02.17 අඟහරුවාදා තෙක් වන දින 10 කාල සීමාව තුළ සිදුකළ යුතු වේ. මෙම කාලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් "දරුවන් හඳුනාගැනීමේ වැඩසටහන" ක්‍රියාත්මක කිරීම සියලු ම විදුහල්පතිවරුන්ගේ වගකීම බව කාරුණිකව දන්වමි.

නාලක කළුවැව
ලේකම්

පිටපත:
ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, ................................... පළාත - කරු.දැ.ගැ.ස

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832, +94112784825, minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary — +94112784811, +94112785162, secretary.education@moe.gov.lk, moesecretaryoffice@gmail.com